සභාපති
தலைவர்
Chairman } (+94) 011 2556840

ලේකම්
செயலாளர்
Secretary } (+94) 011 2556831

කාර්යාලය
காரியாலயம்
Office } (+94) 0112556833
0112556834

ෆැක්ස්
தொலைநகல்
Fax } (+94) 011 2556836
011 2556837

විද්‍යුත් තැපැල
மின்னஞ்சல்
e-mail } fincom@sltnet.lk

# මුදල් කොමිෂන් සභාව
(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 'ඊ' ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලදී.)

# நிதி ஆணைக்குழு
(அரசியலமைப்பின் 154'எ ஆம் உறுப்புரையின்கீழ் தாபிக்கப்பட்டது)

# FINANCE COMMISSION
(Established under Article 154 R of the Constitution)

48, වජිර පාර,
කොළඹ 04, ශ්‍රී ලංකා.

48, வஜிரா வீதி,
கொழும்பு-04, இலங்கை.

48, Vajira Road,
Colombo 04, Sri Lanka.

මගේ අංකය
எனது இல
My No } FC/3/3/2017

ඔබේ අංකය
உமது இல
Your No }

දිනය
திகதி
Date } 2017.02.02

මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 2016/01/(i)

ප්‍රධාන ලේකම්

බස්නාහිර/මධ්‍යම/දකුණු/උතුරු/නැගෙනහිර/වයඹ/උතුරු මැද/ඌව/සබරගමුව පළාත

<u>ප්‍රාග්ධන අරමුදල් යටතේ පළාත් වාර්ෂික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පිළිපැදිය යුතු ක්‍රියාමාර්ග</u>

මුදල් කොමිෂන් සභාව විසින් මෙයට පෙර මෙම විෂයයට අදාලව 2015.12.30 දින නිකුත් කර ඇති අංක 2016/1 දරණ චක්‍රලේඛයට අදාලව පහත සංශෝධන ඔබ වෙත එවනු ලැබේ. ඒ අනුව, එම චක්‍රලේඛයේ 7.2 ( i ), (ii) ,(iii) ,(iv), (v) , 7.3 සහ 7.4 ( i ) පමණක් මෙමඟින් සංශෝධනය කර ඇත.

## 7.2 සමාජ යටිතල පහසුකම් - 30%

i. අධ්‍යාපනය

- "වෙනත් අරමුදල් ප්‍රභවයන් යොදවා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සමග ද්විකරණය නොවන පරිදි රජයේ පාසල්වල ගොඩනැගිලි අලුත්වැඩියාව, ආරක්ෂිත වැට හා ගේට්ටු ඉදිකිරීම, සනීපාරක්ෂක කටයුතු සහ පානීය ජලය ලබා දීම, ක්‍රීඩා භූමි, ළමා උද්‍යාන ඉදිකිරීම හා සංවර්ධනය සිදු කළ හැකිය " *යන්න*

  "වෙනත් අරමුදල් ප්‍රභවයන් යොදවා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සමග ද්විකරණය නොවන පරිදි රජයේ පාසල්වල ගොඩනැගිලි අලුත්වැඩියාව, ආරක්ෂිත වැට හා ගේට්ටු ඉදිකිරීම, සනීපාරක්ෂක කටයුතු සහ පානීය ජලය ලබා දීම, ක්‍රීඩා භූමි, ළමා උද්‍යාන ඉදිකිරීම හා සංවර්ධනය සහ කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය මත පාසැල් සංවර්ධනය සඳහා සෘජුව දායක වන ද්‍රව්‍ය හා උපකරණ ලබා දීම ( පරිගණක, ඩෙස්, පුටු, තූර්ය වාදන භාණ්ඩ, ක්‍රීඩා උපකරණ හා විද්‍යාගාර උපකරණ ආදිය ) සිදු කළ හැකිය. " *යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.*

CamScanner

ii. සෞඛ්‍යය හා සමාජ සේවා

- "අඩු ආදායම්ලාභී පවුල්වල විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට, විශේෂයෙන් පාසල් යන වයසේ දරුවන්ට රු.35,000/- ක උපරිමයකට යටත්ව ඔවුන්ගේ දෛනික ජීවිතය පහසු කරවන විශේෂිත උපකාරක උපකරණ එක් වරක් පමණක් ලබා දිය හැකිය. මෙම උපකරණ ඔවුන්ගේ විශේෂ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි විය යුතුය. මෙවැනි උපකරණ ලබාදීමේ දී ඒ සඳහා වෛද්‍ය නිර්දේශය සහ පළාත් සමාජ සේවා අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගත යුතු වේ. " යන්න
"අඩු ආදායම්ලාභී පවුල්වල විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට, විශේෂයෙන් පාසල් යන වයසේ දරුවන්ට රු.50,000/- ක උපරිමයකට යටත්ව ඔවුන්ගේ දෛනික ජීවිතය පහසු කරවන විශේෂිත උපකාරක උපකරණ ලබා දිය හැකිය. මෙම උපකරණ ඔවුන්ගේ විශේෂ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි විය යුතුය. මෙවැනි උපකරණ ලබාදීමේ දී ඒ සඳහා වෛද්‍ය නිර්දේශය සහ පළාත් සමාජ සේවා අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගත යුතු වේ. " යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

iii. නිවාස

- "පාසල් අධ්‍යාපනය ලබන දරුවන් සිටින අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් නිවාස සඳහා විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට එක් ප්‍රතිලාභී පවුලකට රු.15,000/- ක උපරිමයකට යටත්ව අනුග්‍රාහක මුදලක් ලබා දිය හැකිය. ආදායම් තත්වය පිළිබඳව ග්‍රාම නිලධාරීගේ සහතිකයක් ලබාගත යුතුය. නිවසකට විදුලිය ලබා ගැනීම උදෙසා ලබාදෙන මෙම මුදල ගෙවිය යුත්තේ විදුලි බලය සපයනු ලබන ආයතනයටය" යන්න
"පාසල් අධ්‍යාපනය ලබන දරුවන් සිටින අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් නිවාස සඳහා විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට එක් ප්‍රතිලාභී පවුලකට රු.25,000/- ක උපරිමයකට යටත්ව අනුග්‍රාහක මුදලක් ලබා දිය හැකිය. ආදායම් තත්වය පිළිබඳව ග්‍රාම නිලධාරීගේ සහතිකයක් ලබාගත යුතුය. නිවසකට විදුලිය ලබා ගැනීම උදෙසා ලබාදෙන මෙම මුදල ගෙවිය යුත්තේ විදුලි බලය සපයනු ලබන ආයතනයටය " යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

iv. ග්‍රාම සංවර්ධනය

- "වසර 02 කට වඩා වැඩි කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි මරණාධාර සහ ග්‍රාම සංවර්ධන සමිති සඳහා අවශ්‍යතාවය මත පදනම්ව පුටු හා එකලස් කළ හැකි තාවකාලික ආවරණ රු. 30,000/- ක උපරිමයකට යටත්ව ලබා දිය හැකිය. වසර පහක් ඇතුළත එකම සමිතියකට එකම වර්ගයේ උපකරණ නැවත ලබා නොදිය යුතුය." යන්න
" වසර 02 කට වඩා වැඩි කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි මරණාධාර සහ ග්‍රාම සංවර්ධන සමිති සඳහා අවශ්‍යතාවය මත පදනම්ව පුටු හා එකලස් කළ හැකි තාවකාලික

CamScanner

ආවරණ , ඉවුම් පිහුම් උපකරණ හා විදුලිජනක යන්ත්‍ර වසර 03 ක් ඇතුළත රු. 50,000/- ක උපරිමයකට යටත්ව ලබා දිය හැකිය " යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

- "පානීය අවශ්‍යතා හෝ ස්නානය සඳහා භාවිතා කරනු ලබන පොදු ළිං ඉදිකිරීම හෝ අලුත්වැඩියාව සඳහා රු. 25,000/- ක උපරිමයකට යටත්ව අනුග්‍රාහකත්වය ලබා දිය හැකිය. එම අනුග්‍රාහකත්වය ලබාදිය යුත්තේ ලියාපදිංචි සමිතියක් හරහා පමණි. මේ සඳහා ග්‍රාම සංවර්ධන නිලධාරිවරයාගේ සම්බන්ධීකරණය ලබාගත යුතුය. මෙහිදී ප්‍රතිලාභී දායකත්වය ලබා ගැනීම අනිවාර්ය වේ " යන්න
  "පානීය අවශ්‍යතා හෝ ස්නානය සඳහා භාවිතා කරනු ලබන පොදු ළිං ඉදිකිරීම හෝ අලුත්වැඩියාව සඳහා රු. 100,000/- ක උපරිමයකට යටත්ව ඉදිකිරීමට හෝ අලුත්වැඩියාවට වැය විය හැකි සත්‍ය පිරිවැය පිළිබඳ සලකා බලා අනුග්‍රාහකත්වය ලබා දිය හැකිය. එම අනුග්‍රාහකත්වය ලබාදිය යුත්තේ ලියාපදිංචි සමිතියක් හරහා පමණි. මේ සඳහා ග්‍රාම සංවර්ධන නිලධාරිගේ සම්බන්ධීකරණය ලබාගත යුතුය. මෙහිදී ප්‍රතිලාභී දායකත්වය ලබා ගැනීම අනිවාර්ය වේ " යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

v. ක්‍රීඩා කටයුතු

- " පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂගේ හා විෂයය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලැබූ ක්‍රීඩා නිලධාරියෙකුගේ නිර්දේශය මත ලියාපදිංචි ක්‍රීඩා සමිති සඳහා රු.25,000/- ක උපරිමයකට යටත්ව වසර 05 කට වරක් ක්‍රීඩා භාණ්ඩ ලබා දිය හැකිය" යන්න
  " පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂගේ හා විෂයය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලැබූ ක්‍රීඩා නිලධාරියෙකුගේ නිර්දේශය මත ලියාපදිංචි ක්‍රීඩා සමිති හා යෞවන සමාජ සඳහා එක් සමාජයකට වසර දෙකක් තුළ රු.25,000/- ක උපරිමයකට යටත්ව ක්‍රීඩා භාණ්ඩ ලබා දිය හැකිය යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

- " දිස්ත්‍රික්, පළාත්, ජාතික හා අන්තර්ජාතික මට්ටමේ ක්‍රීඩා තරඟ නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අත්‍යවශ්‍ය වන ඇඳුම්, පාවහන් හෝ ක්‍රීඩා භාණ්ඩ ලබා ගැනීම සඳහා, අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් එක් ක්‍රීඩකයෙකුට දිස්ත්‍රික් මට්ටමේ තරඟ සඳහා රු. 4,000/- ක්, පළාත් මට්ටමේ තරඟ සඳහා රු. 6,000/- ක් හා ජාතික මට්ටමේ තරග සඳහා රු.8,000/- ක් සහ ජාත්‍යන්තර මට්ටමේ තරග සඳහා රු. 10,000/- ක් වන පරිදි අනුග්‍රාහක දීමනා ලබා දීම ද සිදුකළ හැකිය " යන්න
  "දිස්ත්‍රික්, පළාත්, ජාතික හා අන්තර්ජාතික මට්ටමේ ක්‍රීඩා තරඟ නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අත්‍යවශ්‍ය වන ඇඳුම්, පාවහන් හෝ ක්‍රීඩා භාණ්ඩ ලබා ගැනීම සඳහා, අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් එක් ක්‍රීඩකයෙකුට දිස්ත්‍රික් හා පළාත් මට්ටමේ තරඟ සඳහා



CamScanner

රු.8,000/- ක්, ජාතික මට්ටමේ තරඟ සඳහා රු.10, 000/- ක් සහ ජාත්‍යන්තර මට්ටමේ තරඟ සඳහා රු. 15,000/- ක් වන පරිදි අනුග්‍රාහක දීමනා ලබා දීම ද සිදුකළ හැකිය. " යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

- තවද, "පහසුවෙන් හා අරක්ෂාකාරී ලෙස ළමුන්ට අවතීර්ණ විය හැකි පොදු භූමියක ළමා ක්‍රීඩා උද්‍යාන පිහිටුවීමට රු.100,000/- ක උපරිමයක් ලබාදිය හැකිය" යන්න ඇතුළත් කරනු ලැබේ.

## 7.3 ස්වයං රැකියා ප්‍රවර්ධනය- 20%

- "කිසියම් ව්‍යාපෘතියක් සඳහා එක් පුද්ගලයෙකුට උපරිමය රු. 75,000/- ක් වන සේ ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය වන උපකරණ ලබාදිය හැකි අතර, මෙහිදී 50% ප්‍රතිලාභී දායකත්වය ලබා ගත යුතු වේ. මේ යටතේ පාරිභෝගික භාණ්ඩ බෙදා දීම කිසිසේත්ම සිදු නොකළ යුතුය. " යන්න

  "කිසියම් ව්‍යාපෘතියක් සඳහා එක් පුද්ගලයෙකුට උපරිමය රු. 75,000/- ක් වන සේ ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය වන උපකරණ ලබාදිය හැකි අතර, මෙහිදී ප්‍රතිලාභියාගේ ආදායම් තත්වය හා හැකියාවන් පිළිබඳව එක් එක් පළාත් සභාව විසින් සකසනු ලබන නිර්නායක පදනමව අවමය 25% හා උපරිමය 50% වන පරිදි ප්‍රතිලාභී දායකත්වයක් ලබා ගත යුතුය. මෙ යටතේ ව්‍යාපෘතියට අදාල ප්‍රාග්ධන භාණ්ඩ පමණක් ලබා දිය යුතු වේ. පාරිභෝගික භාණ්ඩ ලබා නොදිය යුතුය. " යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

## 7.4 වාරිමාර්ග හා කෘෂිකර්ම- 10%

i. වාරිමාර්ග

- " ගොවි සංවිධාන හෝ ගොවි කණ්ඩායමක් විසින් නඩත්තු කරනු ලබන පොදු කෘෂි ළිං ඉදි කිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා අරමුදල් ලබා දිය හැකිය. මෙම කටයුතු සඳහා 50% ක ප්‍රතිලාභී දායකත්වය ලබාගැනීම අනිවාර්ය වන අතර, එක් ව්‍යාපෘතියක් සඳහා යෙදවිය හැකි උපරිම මුදල රු.'40,000/- කි" යන්න

  "ගොවි සංවිධාන හෝ ගොවින් කණ්ඩායමක් විසින් නඩත්තු කරනු ලබන පොදු කෘෂි ළිං ඉදි කිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා අරමුදල් ලබා දිය හැකිය. මෙම කටයුතු සඳහා ශ්‍රමදයකත්වයේ වටිනාකමද ඇතුළත්ව අවම වශයෙන් 50% ක ප්‍රතිලාභී දායකත්වය ලබාගැනීම අනිවාර්ය වන අතර, එක් ව්‍යාපෘතියක් සඳහා මන්ත්‍රී ප්‍රතිපාදනයෙන් යෙදවිය හැකි උපරිම මුදල රු. 100,000/- කි. " යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.



CamScanner

තවද, "ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන අංශය සඳහා වෙන්කර ඇති ප්‍රතිශතය 30%කි. එසේ වුවද, යම් කිසි මන්ත්‍රීවරයෙකු විසින් ව්‍යාපෘති තෝරා ගැනීමේදී අනිකුත් අංශවල මුදල් ඉතිරියක් තිබේ නම්, එම මුදල් ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන අංශයට එකතු කළ හැකිය. ඒ අනුව, ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලබා දී ඇති 30% ප්‍රතිශතය අභිබවා වියදම් දැරිය හැකිය." යන්න ඇතුලත් කරනු ලැබේ.

අංක 2016/1 දරණ චක්‍රලේඛයට කරනු ලැබූ මෙම සංශෝධන 2017ජනවාරි 01 දින සිට බල පැවැත්වේ. මෙම සංශෝධන පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු අමාත්‍යවරුන්, ගරු මන්ත්‍රීවරුන් සහ සියලුම පළාත් අමාත්‍යාංශවල ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් හා අදාල අනෙකුත් නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

ඒ.ටී.එම්.යූ.ඩී.බී. තෙන්නකෝන්
ලේකම්
මුදල් කොමිෂන් සභාව

පිටපත්:

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කා.දැ.ස.
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය - කා.දැ.ස.
3. ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ස.
4. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කා.දැ.ස.
5. ලේකම්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කා.දැ.ස.
6. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
7. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මහා භාණ්ඩාගාරය - කා.දැ.ස.
8. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
9. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
10. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) - අ.ක.ස.
11. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) - අ.ක.ස.
12. සහකාර විගණකාධිපති - කා.දැ.ස.

CamScanner